**<u>උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධි පන්තියේ දිස්ත්‍රික් විදාතා නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය.</u>**

උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධි පන්තිය සඳහා වන 2018.01.04 දිනැතිව අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන ප්‍රකාරව එම අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධිපන්තියේ දිස්ත්‍රික් විදාතා නිලධාරී තනතුර සඳහා 2018.07.30 දිනට සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා 2018.07.30 දින වන විට සේවයේ යෙදී සිට මේ වන විට විශ්‍රාමික විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ට ද අයදුම් කළ හැක.

1. සුදුසුකම්
   1.1. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/ ගණිතය පිළිබඳ උපාධියක් ලබා තිබීම.
   1.2. පළපුරුද්ද : විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් වශයෙන් වසර 15 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   1.3. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
   1.4. වෙනත් :
      I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
      II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
      III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.
      IV. වයස අදාළ නොවේ.
2. පුරප්පාඩු ගණන : 25
3. වැටුප් පරිමාණය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මෙම තනතුර සඳහා (MN7 – 2016) වැටුප් කේත අංකය හිමි වන අතර, වැටුප් පරිමාණය රු.41,580-11X755-18X1,030-68,425 (මාසික) වේ. (වැටුප් ගෙවීම හා සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 හි විධිවිධානවලට අනුකූල වේ.)
4. බඳවා ගන්නා ක්‍රමය : PSC/EST/03-03/08/2017 හා 2019.04.26 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගය පරිදි මෙවරට පමණක් අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් ලිඛිත විභාගයකින් තොරව, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. ඒ අනුව පහත දැක්වෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ලකුණු දීමේ පරිපාටිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහිදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූප වන පරිදි සුදුසු අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ. බඳවා ගනු ලබන නිලධාරීන් ගණන සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටිය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | ලකුණු බෙදීමේ ක්‍රමය | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය | මෙම බඳවා ගැනීමේදී මූලික සුදුසුකම ලෙස සලකා බැලෙන විද්‍යා හා තාක්ෂණ නිලධාරී වශයෙන් සේවය කර ඇති වසර 15ක සේවා කාලයට අමතරව සේවය කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රා.සේ.කො.ස. චක්‍රලේඛ 01/2019 අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී වැඩිම සේවා කාලයක් සහිත අයදුම්කරු හෝ අයදුම්කරුවන්ට උපරිම ලකුණු ප්‍රමාණය ලැබෙන පරිදි සෙසු අයදුම්කරුවන්ට ඊට සමානුපාතිකව ලකුණු හිමිවේ. | | 40 |
| කුසලතාවය | I. සේවා කාලය තුළ (ප්‍රාදේශීය වශයෙන් බලපා තිබූ ගැටළුවකට විසඳුමක් වශයෙන් ) ක්‍රියාත්මක මට්ටමට පත්කළ තාක්ෂණ පැවරුම් / ව්‍යාපෘති සිදු කර තිබීම. (ව්‍යාපෘතියකට ලකුණු 05 බැගින්)<br>(අදාළ දෙපාර්තුමේන්තු හෝ ආයතන ප්‍රධානියා විසින් නිලධාරියාගේ ඍජු දායකත්වය ලැබුණු බවට ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය) | 20 | |
| | II. පරිගණක සාක්ෂරතාවය<br>a. ඩිප්ලෝමා පාඨමාලාව - මාස 06 හෝ ඊට වැඩි පාඨමාලා (පැය 720 හෝ ඊට වැඩි) - ලකුණු 10<br>b. සහතික පත්‍ර පාඨමාලා (මාස 03 මාස 06 අතර/පැය 360-720 අතර) - ලකුණු 08<br>c. සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 03 ට අඩු/ පැය 360ට අඩු) - ලකුණු 05<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ) | 10 | |
| | III. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව<br>a. ඩිප්ලෝමා පාඨමාලාව - මාස 06 හෝ ඊට වැඩි පාඨමාලා (පැය 720 හෝ ඊට වැඩි) - ලකුණු 10<br>b. සහතික පත්‍ර පාඨමාලා (මාස 03 මාස 06 අතර/පැය 360-720 අතර) - ලකුණු 08<br>c. සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 03 ට අඩු/ පැය 360ට අඩු) - ලකුණු 05<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 10 | |
| | IV. උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ලැබූ ප්‍රශංසා සහතික සඳහා ( පොදු 230 බී ආකෘතියට අනුව ඇති එක් සහතිකයක් සඳහා ලකුණු 02 බැගින්) | 10 | |

| | | | |
|---|---|---|---|
| | V. රාජකාරී විෂය ක්ෂේත්‍රයට අදාළව සිදුකර ඇති ප්‍රකාශන<br>a. පළ කළ පොත් - ලකුණු 05 බැගින්<br>b. පර්යේෂණාත්මක ප්‍රකාශන - ලකුණු 2.5 බැගින්<br>c. ප්‍රභාෂ්වර බ්ලොග් අඩවියේ පළකළ ලිපි හා වාර්තා / පුවත්පත් ලිපි/ වාර්තා - ලකුණු 02 බැගින්<br>ආයතන ප්‍රධානියාගේ / ප්‍රාදේශීය ලේකම්ගේ ලිඛිත සනාථ කිරීම මත උපරිම ලකුණු සීමාවට යටත්ව උපරිම ප්‍රකාශන 05ක් සලකා බැලේ.<br>උපාධිය සඳහා ඉදිරිපත් කළ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 10 | |
| මුළු ලකුණු | | | 100 |

* ඉහත II හා III යටතේ සලකා බලනුයේ රජයේ පිළිගත් ආයතනයකින් ලබා ඇති පාඨමාලා පමණි.

* එම පාඨමාලාවල කාලසීමාවන් හා බලාත්මක දිනය අදාළ සහතික පත්‍රයෙන් තහවුරු නොවේ නම් එය පැහැදිළිව තහවුරු කෙරෙන ලේඛනයක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු වන අතර, එසේ නොමැති පාඨමාලා සහතික පත්‍ර සලකා බලනු නොලැබේ.

05. අයදුම් කිරීමේ ක්‍රමය : මේ සමඟ ඉදිරිපත් කර ඇති අයදුම්පත සම්පූර්ණ කර 2020.02.10 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට ගෙනැවිත් භාරදිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"දිස්ත්‍රික් විද්‍යා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2020"** යනුවෙන් සඳහන් කළ යුතුය. මෙම තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටිය සහ තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර අමාත්‍යාංශයේ www.mostr.gov.lk වෙබ් අඩවියෙන් දැක්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුර දිසානායක

ලේකම්,

උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

3 වන මහල, සෙත්සිරිපාය - I වන අදියර,

බත්තරමුල්ල.

2020.02.21